**(හැඳින්වීම)**

අද සාමාන්‍ය සමයේ 30 වෙනි ඉරුදින යි.

අදට නියමිත පළමු දේව ප්‍රකාශනයෙන් සමිඳාණන් වහන්සේ සිය සෙනඟ අසරණභාවයෙන් ගලවා ගෙන, ඔවුන් සනසමින් තම දේශය වෙත ආපසු කැඳවා ගෙන එන බව ජෙරමියා දිවැසිවරතුමන් ප්‍රකාශ කරයි.

දෙවියන් වහන්සේ විසින් ම ක්‍රිස්තුන් වහන්සේ සිය සෙනඟ උදෙසා සදහට ම පූජකයෙක් ලෙස පත් කළ බව දෙවන දේව ප්‍රකාශනයෙන් ශුද්ධ වූ පාවුළු තුමන් අවධාරණය කරනු ලබයි.

බර්තිමේයස් නම් අන්ධ මිනිසාට සුවය දානය කිරීම අද සුපුවතින් ඉදිරිපත් කරනු ලබන අතර, ආධ්‍යාත්මික අන්ධභාවයෙන් මිදී, ක්‍රිස්තු ආලෝකය තුළ නිසි ලෙස ලොව දකින්නට අප සැමට ආරාධනා කරයි.

එම ආරාධනයට අප සිත් අවදි කරමින්, ලෞකික වහල්භාවයෙන් සහ ඇතුළාන්ත අන්ධභාවයෙන් මිදී, ලෝකයේ ආලෝකය වන ක්‍රිස්තුන් වහන්සේ අනුගාමී වන්නට අවැසි නිසි දැක්ම සහ විශ්වාසය ඉල්ලා, අපි සැම මෙම ශුද්ධ වූ යාගයට ගෞරවයෙන් සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී, ශුද්ධ වූ සභාවට එල්ලවන සියලු අභියෝග සහ පීඩාවන් ඉදිරියෙහි නොසැලී සුභාරංචිය ලොව පුරා පතල කරන්නට, ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ඇතුළු පූජක සහ පැවිදිවරුන්ට අවශ්‍ය දිරිය , බලය සහ සුවය නිරතුරු දානය කරන පිණිස,

2) ආදර දෙවි පියාණනී, දේව වචනයේ ආලෝකය තුළ ආධ්‍යාත්මික අන්ධභාවයෙන් මිදී, සියලු ලෞකික වහල්භාවයන් හැර දා, සැබෑ ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස දිවි ගෙවන්නට, අප සැමට අවැසි වරම් දානය කරන පිණිස,

3) ආදර දෙවි පියාණනී, මමත්වය සහ ආත්මාර්ථකාමී සිතුවිලි බැහැර කරමින්, සියලු ලක් වැසියන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරන්නට සහ වංචා - දූෂණ පිටු දකිමින් සදාචාරවත් දේශපාලන ක්‍රමයක් ඇති කරන්නට, අප රටේ සියලු ජන නායකයන් මෙහෙයවන පිණිස,

4) ආදර දෙවි පියාණනී, අප සියල්ලන් තුළ දුබලකම් සහ පාපී භාවයන් ඇති බව නිහතමානීව පිළිගනිමින්, කිසිවෙක් ක්‍රිස්තුන් වහන්සේ වෙතින් නොවළක්වන්නට ද, සැනසුම හා සුවය අවැසි සැම සමිඳු ප්‍රේමය වෙත කැඳවා ගෙන එන්නට ද, අප මීසම් සංඝයට නිබඳ ව මග පෙන්වන පිණිස,